# කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2019

## දිලික්ත නීතිය
(පැ තුනයි )

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : **07**

ඕනෑම ප්‍රශ්න **හතරකට (04)** පමණක් පිළිතුරු සපයන්න.
(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)

---

01. නීතිවිරෝධීභාවය (unlawfulness) සහ නොසැලකිල්ල (negligence) යනු ඒවාටම ආවේනික වූ අවශ්‍යතාවන් සහ පරීක්ෂණයන්ගෙන් සමන්විත එකම දිලික්තයේ වෙන්වූ හා එකිනෙකට වෙනස් වූ සංරචක (components) දෙකක් වන බැවින්, ඒවා පටලවා ගැනීමෙන් හෝ ඒකාබද්ධ කිරීමෙන් වැළකිය යුතු ය.

*Administrateur, Transvaal v Van der Merwe* 1994 (4) SA 347 (A) at 364

ඔබ ඉහත ප්‍රකාශය හා එකඟ වන්නෙහි ද? අක්විලියානු නඩු කරයේ මෙකී සංරචක දෙකට අදාළ සමකාලීන අධිකරණ තීන්දු සහ මූලධර්ම ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

02. රොහාන්, ඒබීසී පීඑල්සී බැංකුවෙහි (ABC Bank Plc) බැංකු විධායක නිලධාරී (CEO) තනතුර සඳහා ඉදිරිපත්ව ඇති අවසන් අයදුම්කරුවන් අතරින් එක් අයෙකු විය. අවසන් සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දී රොහාන් සිය වැගන් ආර් වීඑක්ස්අයි (WagonR VXI) රථය ඒබීසී පීඑල්සී (ABC Bank Plc) බැංකුවේ මූලස්ථානය වෙත පදවාගෙන ගියේය. එහි සිටි ආරක්ෂක නිලධාරියකුගේ උදවු ඇතිව ඔහු සිය රථය වාහන නැවත්වීම සඳහා වෙන්කර ඇති රථගාලෙහි නැවැත්විය. සම්මුඛ පරීක්ෂණය අවසන් වූ වහාම ඔහු රථගාල වෙත පැමිණියේ ය. එහිදී ඔහු තම මෝටර් රථයේ ඉදිරිපස කොටස බරපතල ලෙස හානි වී ඇති බව දුටුවේය. රථගාලේ කාර්ය මණ්ඩලය, ඔහු භාවිතා කර ඇත්තේ සාමාන්‍යයෙන් වෙනත් කිසිම අයෙකුට වාහන නැවත්වීමට අවසර නොමැති, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාගේ (CEO) වාහනය නැවත්වීමට වෙන්කර ඇති ස්ථානයේ බව සඳහන් කරමින් චෝදනා කළේය. ප්‍රධාන විධායක නිලධාරියාගේ රියදුරු තම ස්වාමියාට ප්‍රමාද වීම වලක්වනු අටියෙන් වෙනත් නැවතුම් ස්ථානයක රථය නැවත්වීමට පසුපසට පදවන අවස්ථාවේදී රොහාන්ගේ රථයට

හානි සිදුවූ බව ඔවුහු තවදුරටත් රොහාන්ට පැවසූහ. ඒබීසී පීඑල්සී බැංකුවෙහි (ABC Bank Plc) පරිපාලන නිලධාරිහු රොහාන්ට රථගාලේ ඇතුල්වීමේ දොරටුවේ ප්‍රදර්ශනය කර ඇති දැන්වීම උපුටා දක්වමින්, වාහන නවත්වන්නන් අවදානම තමන් විසින්ම දරාගත යුතු බව පැහැදිලි කළහ. එමෙන්ම, රොහාන්ගේ වාහනයට සිදු වී ඇති හානිය අලුත්වැඩියා කිරීමට සඳහා වගකීමක් සමාගමට නැති බව ඔවුහු වැඩිදුරටත් සඳහන් කළහ.

තමාට සිදු වූ අලාභ සඳහා ඒබීසී පීඑල්සී බැංකුවට (ABC Bank Plc) විරුද්ධව නඩු පැවරීමට රොහාන් අපේක්ෂා කරයි. අදාල දිලික්ත/ තෝරත මූලධර්ම සහ නඩු තීන්දු නීතිය සඳහන් කරමින් ඔහුට උපදෙස් දෙන්න.

03. (අ) බෝලම් පරීක්ෂණය, බොලිතෝ එදිරිව හැක්නි නාගරික සෞඛ්‍ය බලධාරී (*Bolitho v City Hackney Health Authority*) නඩුවේ දී තහවුරු කළ නීතිමය ස්ථාවරය නොතකමින්, වෛද්‍ය නොසැලකිල්ල සම්බන්ධ නඩු වල දී පැමිණිලිකරුවන්ට දරාගත නොහැකි බාධාවක්ව තිබේ.

ඔබ එකඟ වන්නෙහි ද? අදාළ නඩු තීන්දු නීතිය ඇසුරින් ඔබගේ තර්කය තහවුරු කරන්න.

(ලකුණු 12.5)

(ආ) අදාළ ව්‍යවස්ථාපිත නීතිය සහ නඩු තීන්දු නීතිය උපුටා දක්වමින් සමකාලීන අධිකරණ බල ප්‍රදේශවල වෛද්‍ය නොසැලකිල්ල සම්බන්ධ නීතිය "අයිතීන් පදනම් කරගත් ප්‍රවේශය" යන සංකල්පය හරහා හැඩගැස්වී ඇත්තේ කෙසේදැයි යන්න පරීක්ෂා කරන්න.

(ලකුණු 12.5)

04. මිහිරි යනු සිනමා ක්ෂේත්‍රයේ සිය නමක් දිනා ගැනීමේ අපේක්ෂාවෙන් පසුවන වෘත්තීමය ගායිකාවකි. ඇය ලෝකයේ වැඩිම ප්‍රේක්ෂකයන් පිරිසක් නරඹන තරඟයක් වන "ඩ්‍රීම් ටීවී" (Dream TV) ගායන තරගයට ඇතුලත් විය. මෙම වැඩසටහන සජීවීව සියලු රටවල් වල විකාශය වේ. තරගයේ හොඳම තරඟකරුවන් විසිපස් දෙනා අතරට මිහිරි ගේ නම ද ඇතුලත් ව තිබුණි. තරගයේ දසවන වටය අතරතුර දී සංවිධායකයින් ඊළඟ වටය සඳහා තරගකරුවන් දස දෙනෙක් තෝරාගැනීමට තීරණය කල අතර, තවත් ප්‍රසිද්ධ ගායිකාවන් දෙදෙනෙක් සමඟ විනිශ්චයකරුවෙකු ලෙස, සිනමා ක්ෂේත්‍රයේ සංගීතඥයෙකු වූ සුගත් මහතාට ආරාධනා කර තිබුණි. මිහිරිගේ ඉදිරිපත් කිරීම දැකීමෙන් පසුව හඬනගා සිනාසුනු සුගත් මහතා 'ඔබගේ ගායන හැකියාව ගැන ඔබ ආඩම්බර විය යුතුයි' යනුවෙන් උපහාසාත්මක ලෙස කියා සිටියේ ය. එම වටය අවසානයේ දී මිහිරිට තරගයෙන් ඉවත්වීමට සිදුවිය. ඉන් අනතුරුව, මිහිරිගේ ගායන කුසලතාවය සහ සිනමා ක්ෂේත්‍රයට එක්වීමට ඇයට ඇති අභිලාශය හාස්‍යයට ලක් කරමින් අන්තර්ජාලය පුරා හිරිහැරකාරී මතවාද සීඝ්‍රයෙන් පැතිර යන ලදී.

සුගත් මහතාගේ හැසිරීම, ඔහු තමා සමඟ ඇති අමනාපයක් බලපෑමෙන් වූවක් බව මිහිරි දැඩිව විශ්වාස කරයි. පොදු විභාග වලදී සුගත් මහතාගේ දියණිය වන කාව්‍යාට වඩා, තමා සාර්ථක වූ නිසා මෙම තත්වය තියුණු වූ බව ඇය සිතයි.

සුගත් මහතාට සහ ඩ්‍රීම් ටීවී (Dream TV) ආයතනයේ කළමණාකාරිත්වයට එරෙහිව අපහාස නඩුවක් ගොනු කිරීමේ හැකියාවන් සම්බන්ධයෙන් මිහිරිට උපදෙස් ලබා දෙන්න.

05. ඩැනියල් කුළුබඩු ව්‍යාපාරිකයෙකි. වසර 15ක වෘත්තීය අත්දැකීම් සහිත ආයෝජන උපදේශකයෙක් වන විමල් ගේ උපදෙස් මත ඔහු, සුමුතු පොදු සීමාසහිත සමාගම හි (Sumuthu Plc) කොටස් වලට රුපියල් බිලියන 03ක් ආයෝජනය කළේය. ඩැනියල් එසේ ආයෝජනය කල විගසම සුමුතු පොදු සීමාසහිත සමාගම හි (Sumuthu Plc) කොටස් වල මිළ පහල වැටීමට පටන් ගන්නා ලදී. ඒ හේතුවෙන් එක දිනක් ඇතුලත සුමුතු පොදු සීමාසහිත සමාගම (Sumuthu Plc) බංකොලොත් වූ බව ප්‍රකාශයට පත්විය. මේ සම්බන්ධව තම නියෝජිතයාගෙන් ලැබුණු දුරකථන ඇමතුමකින් පසුව ඩැනියෙල් ක්ලාන්ත වූ අතර ඔහුව වහාම රෝහලට රැගෙන යන ලදී. වෛද්‍යවරු ඔහුව පරීක්ෂා කොට පවසා සිටියේ ඔහුට ආඝාතය වැළදී තිබූ බවත්, ඒ හේතුවෙන් ඔහුගේ ශරීරයේ වම් කොටස අඩපණ වී අංශභාග තත්වයට පත්වී ඇති බවයි.

ශුද්ධ මූල්‍ය හානිය සහ ස්නායු කම්පනය සම්බන්ධයෙන් විමල්ට විරුද්ධව නඩු පැවරීමේ හැකියාව පිළිබඳව ඩැනියල් ඔබගේ උපදෙස් පතයි. අදාළ අධිකාරීන් සඳහන් කරමින් ඔහුට උපදෙස් ලබා දෙන්න.

06. සමන් දවසේ පැය 24 පුරා විවෘතව පවතින “ ග්‍රීන් සිටි” (Green City) සුපිරි වෙළඳසැලේ අයිතිකරු වේ. තම සුපිරි වෙළඳසැල පිරිසිදු කිරීම සඳහා ඔහු “මාස්ටර් ක්ලීනර්ස්” (Master Cleaners) පෞද්ගලික සමාගමේ සේවය කුලියට ගත්තේය. පිරිසිදු කරන්නාන් පැය 08ක සේවා මුර අනුව සේවය කල යුතු බව සේවා ගිවිසුම නියම කරයි. පිරිසිදුකරුවන් සෑම මිනිත්තු 30 කටම වරක් අදාළ පරිශ්‍රය පරීක්‍ෂා කර කිසිවක් බිම විසිරී නොමැති බවට තහවුරු කිරීම අවශ්‍ය වේ. 2018 ඔක්තෝබර් මස 17 වන දින පිසින තෙල් මිල දී ගැනීම සඳහා රමණී “ග්‍රීන් සිටී” සුපිරි වෙළඳසැලට ගියාය. ඒ වන විටත් ඇයගේ දියණියව පාසලෙන් කැටුව ඒම සඳහා ප්‍රමාද වී තිබුණු බැවින්, පිසින තෙල් බෝතලයක් ලබා ගැනීමට ඇය “මූළුතැන්ගෙයි අවශ්‍යතා” අංශයට කඩිමුඩියේ පිවිසියාය. ඇය පිසින තෙල් තබා ඇති රාක්කය වෙත ප්‍රවේශ වන විටම, බිම විසිරී තිබූ තෙල් ස්වල්පයක් මත ලිස්සා ඇදවැටුණි. ඒ හේතුවෙන් ඇයගේ හිස දරුණු ලෙස තුවාල වූ අතර මාස 06ක් මුළුල්ලේ ඇයට ඇඳ විවේක ගැනීමට සිදුවිය. මෙම

සිදුවීමෙන් පසුව සමන් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකල අතර, එමගින් 2018 ඔක්තෝබර් මස 17 වන දින මුළුතැන්ගෙයි අවශ්‍යතා අංශය පිරිසිදු කිරීම සඳහා රාජාව අනියුක්ත කර තිබූ බව සොයාගන්නා ලදී. සමන් සීසීටීවී (CCTV) දර්ශන අධීක්ෂණය කොට මිනිත්තු 45ක් පමණ කාලයක් මුළුල්ලේ තෙල් බිම විසිරී තිබී ඇති බව සොයා ගත්තේය.

රමණී තමාට ඇතිවූ තුවාල සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂා කරයි. ප්‍රතිපුරුෂ වගකීම යන මූලධර්මය අනුව තමාට කුමන විත්තිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිද යන්න සම්බන්ධයෙන් රමණීට උපදෙස් දෙන්න. නඩු තීන්දු නීතිය ආශ්‍රයෙන් ඔබගේ තර්කයන් තහවුරු කරන්න.

07. අන්තරාදායක ක්‍රියාවන් වලට අභියෝග කිරීමට නීති පද්ධති විවිධාකාරයෙන් ප්‍රතිචාර දක්වති. ඇතැම් නීති පද්ධතීන් යථාර්ථ වගකීම පනවන අතර, අනෙකුත් නීති පද්ධතීන් වරද පදනම් කරගත් වගකීම අදාළ කරගනියි.

අන්තරාදායක ක්‍රියාවන් සහ වස්තූන්ගේ බලපෑම සැලකිල්ලට ගනිමින් නූතන නීති පද්ධතීන් හී වගකීම කෙරෙහි ඇති වෙනස් වූ ප්‍රවේශයන් සාකච්ඡා කරන්න. ඔබගේ මතය අනුව, අන්තරාදායක ක්‍රියාවන් සහ වස්තූන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට වඩා සුදුසු ප්‍රවේශය වන්නේ කුමක්ද? ශ්‍රී ලංකාවට අමතරව අවම වශයෙන් තවත් එක් අධිකරණ බලප්‍රදේශයක් සමග සංසන්දනය කරමින් අදාළ නඩු තීන්දු නීතිය සහ ව්‍යවස්ථාපිත නීති ගෙනහැර දක්වමින් ඔබේ තර්කය තහවුරු කරන්න.

*****